15 වන පිටුවෙන් (අදිසි)

දාහතේ වත්තට ඇතුල් වන තැනම ඇති මාලු ලෑල්ල සෝමදාස ගේ ය. වත්තට ඇතුල් වන සියල්ලන්ටම නියත දඩුවමක් විඳින්නා සේ නාස් අකුළා ගන්නට සිදුව ඇත්තේ මාලු ලෑල්ල නිසා ය. උදෑසන සිට සවස් වන තෙක් තහඩු තට්ටුව මත දුක් විඳිනා මාලුන් සනසන්නට මෙන් විනාඩි පහෙන් පහට සෝමදාස උන් මතට දමන වතුර බේරී ගොස් තට්ටුවට පිටුපසින් කුණු ඇලට වැටෙයි. ඇලේ ගලා යන ජලයට වඩා මාලු වතුර පිරිසිදු බැවින් කිසිදු පරිසර දූෂණයක් සිදු නොවෙයි.

''සාලයො කිලෝ එකක් දාපං...'' සුනන්ද සයිකලයෙන් නොබැස ම කෑ ගසා කියයි.

''අද මාලු ටිකක් ගණං සුනයියා'' සෝමදාස කියන්නේ මුවත් තියමින් සිටි මාලු පිහියේ මුවාත පරීක්ෂා කරන අතර ය.

''ඇයි..? බෝම්බ පුිරුණ නිසා ද..?''

''මාලුකඩේ ගාණනේ.. වාරකං හින්දා වෙන්ඩෑති..''

''ආච්චිගෙ රෙද්ද.. වාරකං.. එහෙනං අවුරුද්දෙ දවස් තුන්සිය හැට පහේම වාරකං වෙන්ඩ ඇති.. බයිල කියන්නැතුව ඔන්න ඕක කිරපං.. මං උඹෙන් ගණං ඇහුව නෑනෙ..''

''අද වාසියක් වෙලා වගෙයි..'' මාලු පාර්සලය සුනන්ද අතට දෙන අතරේ සෝමදාස අසන්නේ ඇසක් අඩවන් කරමිනි. අතේ මුදල් ගැවසෙන දාට සුනන්ද පමණක් නොව වත්තේ හැම කොල්ලකුම ලෝස් නැති බව සෝමදාස දනියි. ''මන්ත්‍රීතුමාගෙ ජීප්පෙකත් දවල් ගේ පැත්තට යනවා මං දැක්කා..''

''මන්තිරිතුමා හින්දා කරළ පැහුණෙ සුනාගෙ විතරයි..'' සුරුට්ටු ධර්මේ කියන්නේ සුනන්දගේ සයිකලය නෑසෙන මානයට ගිය පසුවය. ඔහුට පිළිතුරක් ලෙස යමක් කියන්නට සෝමදාස උත්සාහ නොකරයි. කිසිම දෙයක් සම්බන්ධයෙන් කිසිම අදහසක් ප්‍රකාශ නොකර සිටීම වඩා ආරක්ෂාකාරී බව ඔහු දනියි. වෙළෙන්දෙකු සර්ව පාක්ෂික විය යුතු ය. හෘද සාක්ෂිය යටපත් කරගෙන සිටින්නට සිදුවීම එක අතකින් කරුමයක් නොවේදැයි සෝමදාසට සිතෙයි.

****

කොට්ටං ගස් වල දිග සෙවණැලි ඇලේ කලු පැහැ වතුර මත වැටී ඇත. නිවී සැනසිල්ලේ පිහිනා යන කබරයකු නංවන දිය රැළිති මෙහා ඉවුර දක්වාම ඇදී එයි. කපුටන්ගේ දවසේ ගෝසාව තවම නැවතී නැත.

සිය බයිසිකලය පිටුපස පෙට්ටියක් සවි කරගත් ඉදිආප්ප වෙළෙන්දා සීණුව හඬවමින් පටු මාවත ඔස්සේ සයිකලය පැද යයි. මාවතේ මැද විකට් කණු සවිකර ගත් කොල්ලෝ ක්‍රිකට් ගසති. වැඩි දෙනකුගේ උඩු කය නිරුවත් ය. දාඩිය වැගිරෙණ සිරුරින් යුතු කොල්ලන් දකින විට තිසල්ට තමාගේ කුඩා කාලය සිහිපත් වෙයි. බොත්තම් කැඩුණ කොට කළිසම ඉදිරිපසින් ගැටයක් දමාගත් තමා එක් කළෙක මේ කොලු රැළ මැද සිටි ආකාරය මනසින් දකිද්දී ඔහුගේ මුවට මඳ සිනාවක් නැගෙයි.

''උඹ දවල්ට කෑව ද පුතේ...?'' පොඩිනෝනා අසන්නේ තිසල් ගෙට ගොඩවන්නටත් පෙර ය. ඒ පැනය අසන්නේ පුරුද්දට ය. පිළිතුරක් බලාපොරොත්තුවෙන් නොවේ. පාඩම් කරන්නට පන්සලට යන සෑම දිනකම දිවා ආහාරය පන්සලෙන් නොවැරදී ලැබෙන බව ඇය දනියි.

''සාලයො බැදලා පරිප්පු උයලා තියෙනවා.. බත් බෙදාගෙන කාපන් පුතේ..''

තිසල් පොත් කීපය මේතය මත දමා පුටුවේ වාඩි වෙයි. ඊයේ පන්තියේදී අනුෂාගෙන් ඉල්ලාගත් ව්‍යවහාරික ගණිතය අච්චු පොත තවමත් මේසය මත ය. කලබල කර ඉල්ලා ගත්ත ද එය පෙරළා බලන්නට වත් ඉස්පාසුවක් නොවී ය. තිසල් පුටුවේ වාඩි වී පොත පෙරලා බලයි. පොත මැද කුඩා ලියුම් කැබැල්ලකි. ඔහු එය දිගඇර බලන්නේ කුතුහලයට ය.

''තිසල්.. ආදරෙයි.. අනුෂා'' බෝල අකුරින් ලියා ඇති වගන්තිය තිසල්ගේ මුවට නංවන්නේ අවඥා සහගත සිනාවකි.

''පිස්සු..'' ඔහු කොල කැබැල්ල ගුලි කොට ජනේලයෙන් එළියට විසි කර දමයි.

''ආව ගමන්ම ආයෙම පොතට මූණ ඔබාගන්නද යන්නෙ..?'' අම්මාගේ කටහඬ ඇසෙයි. ''... හිටින්ඩ මං තේ එකක් වත් හදලා දෙන්නං..''

එපා යි කියන්නට නොසිතෙයි. මේ වෙලාවේ තේ කෝප්පයක් බොන්නට ඇත්නම් අපූරු ය. අම්මා සාදන ඉඟුරු තේ කෝපපය තරම් රසවත් බීමක් තවත් නැත.

''කෝ අයියා..?'' තිසල් අසන්නේ අම්මා අතින් තේ කෝප්පය ගන්නා අතරේ දී ය.

''රණසිංහ මහත්තලෑ දිහා ගියේ.. එන්ඩ කියලා පණිවිඩයක් එවලා තිබුණා..''

''මේ හවස..?'' ප්‍රශ්නයක් අසන්නට ඕනෑ නිසා එසේ ඇසුව ද අයියාගේ ගමන් බිමන් වලට වෙලාවක් කලාවක් නැති බව තිසල් දනියි. ''රණසිංහ මහත්තයා අයියගෙ හොඳ හිතෙන් ප්‍රයෝජන ගන්නවා.. මං ඒකට කැමති නැහැ..''

අම්මා සුසුමක් හෙළයි. තිසල්ගේ කියමන ගැන කියන්නට ඇගේ සිත තුළ ද බොහෝ දේ ඇත. ඒ සියල්ල කියා තිසල්ගේ හිස පුරවන්නට ඇයට නොසිතෙයි.

''රණසිංහ මහත්තයා නාගරික මන්ත්‍රී කාලෙත් අපේ වත්තට හිතවත්.. ලොකු එකාගෙයි මහත්තයාගෙයි හිතවත් කම් ඒ කාලෙ ඉඳන් එන එකක්නෙ.. මහත්තයා ලොකූට එන්ඩ කියන්නෙ ඒ නිසානෙ..'' හිත හදාගන්නට එය හොඳ නිදහසට කාරණයකි. අම්මා මේ කතා කරන්නේ හිතට විරුද්ධව බව තිසල් දනියි.

''ඒ කාලෙ රණසිංහ මහත්තයායි දැං ඉන්න රණසිංහ මහත්තයායි කියන්නෙ එක්කෙනෙක් නෙවෙයි අම්මෙ.. දෙන්නෙක්.. සම්පූර්ණයෙන්ම වෙනස් දෙන්නෙක්''

****

මුර කූඩුවේ නිදි කිරමින් සිටි පොලිස් භටයා ප්‍රශ්න කිරීමකින් තොරව ගේට්ටුව අරින්නේ ඔහු සුනන්ද හොඳින් අඳුනන බැවිනි. සවස තුනෙන් පසු මන්ත්‍රී තුමා ඡන්ද දායකයන් හමු නොවන බැවින් වත්ත පාලු ය. ඈත බංගලාව ඉදිරියේ මන්ත්‍රීතුමාගේ අලුත්ම ප්‍රාඩෝව නවත්වා තිබෙනු සුනන්දට පෙනෙයි.

බංගලාව දෙසට නොගොස් කාර්යාලට දෙසට යන්නට සුනන්ද සිතයි.

''එනකල් බලං හිටියා..'' කාර්යාලයේ අඩවන් දොරෙන් ඇතුල් වන සුනන්ද දකින අයේෂාගේ මුහුණ රෝස මලක් සේ පිබිදෙයි. ඈ සූදානම් වෙමින් සිටියේ වැඩ අවසන් කර ගෙදර යන්නට ය.

''කව්ද..?''

''මන්ත්‍රීතුමා... මාත් බලං හිටියා..''

''මනස්ගාත..... කෝ දැන්..?'' සුනන්ද අසන්නේ නොයිවසිල්ලෙනි.

''නාගන්න යනවා කිව්වා.. කොහොමටත් තව පැය බාගයකින් වත් එළියට එක එකක් නෑ'' සුනන්ද අසළින්ම සිටගෙන සිටින අයේෂාට ඔහුගේ සිරුරේ උණුසුම දැනෙන්නා සේ ය. දැන් දැන් ඔහු හැරී තමා සිප ගනු ඇතැයි ඇගේ යටි සිත කියයි. මන්ත්‍රීතුමා නම් එහෙම ය.

ලබන කළාපයට

